# යුරෝපා ඉතිහාසය

## 6.2 ඇමරිකානු නිදහස් සටන



Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

## ඇමරිකානු නිදහස් සටන යනු කුමක් ද ?

ඇමරිකානු ජනපද වාසීන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස ලබා ගැනීම සඳහා ගෙන ගිය සටන ඇමරිකානු නිදහස් සටන ලෙස හැඳින්වේ.

## ඇමරිකානු නිදහස් සටන ඇතිවීමට බලපෑ හේතු

### 1. බ්‍රිතාන්‍ය වාණිජවාදී ප්‍රතිපත්තිය

බ්‍රිතාන්‍ය වෙළෙඳුන්ට මෙන් ම බ්‍රිතාන්‍ය රජයට ද වාසි ප්‍රයෝජන ලැබෙන අයුරින් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව මගින් සම්මත කර ගත් ප්‍රතිපත්තියක් ඇමරිකානු ජනපදවල ක්‍රියාත්මක විය. එය වාණිජවාදී ප්‍රත්පත්තිය නම් විය. මෙම ප්‍රතිපත්තියට අනුව ඇමරිකානු ආනයන - අපනයන කටයුතුවලට අදාළව විශේෂිත ප්‍රතිපත්ති කිහිපයක් ක්‍රියාත්මක වේ.

එම ප්‍රතිපත්ති :-

- වෙළෙඳ ද්‍රව්‍ය ඉංග්‍රීසි වෙළෙඳුන්ට පමණක් අලෙවි කළ යුතු බවට නියම කිරීම
- විදේශ භාණ්ඩ මිලට ගැනීමේ දී ඒවා බ්‍රිතාන්‍ය වරායකට ගෙන ගොස් ඇමරිකානු ජනපදවලට ගෙන ඒමට නියම කිරීම
- ඉංග්‍රීසි නිෂ්පාදනවලට තරගයක් එල්ල වන භාණ්ඩ ඇමරිකාවේ නිෂ්පාදනය තහනම් කිරීම

මුල් කාලයේ දී මෙම ප්‍රතිපත්තිය ඇමරිකානුවන්ට හානියක් නොවී ය. ඔවුන් තමන්ට වාසි ලබා ගත හැකි වන සේ බ්‍රිතාන්‍යයට රහසින් වෙළෙඳ කටයුතුවල යෙදුණි. නමුත් 1763 දී මෙම තත්ත්වය වෙනස් විය. බ්‍රිතාන්‍යය සත් අවුරුදු යුද්ධයෙන් ජයග්‍රහණ රාශියත් අත්පත් කර ගත්ත ද දැඩි ආර්ථික පරිහානියකට පත් විය. මෙම තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා ඇමරිකානු ප්‍රතිපත්තිය දැඩි කිරීමට බ්‍රිතාන්‍යය ආණ්ඩුව කටයුතු කරන ලදි.ඒ අනුව වාණිජවාදී ප්‍රතිපත්තිය දැඩිව ක්‍රියාත්මක විය.

සත් අවුරුදු යුද්ධය යනු,
ඔස්ට්‍රියාවේ කිරුළ වෙනුවෙන් බ්‍රිතාන්‍යය හා ප්‍රංශය අතර ඇතිවූ සටන යි.

අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී. එම්. මොරගොඩ මයා. ජාතික. තරුණ සේවා සභාව. (2017-2018)
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## වාණිජවාදී ප්‍රතිපත්තිය දැඩිව ක්‍රියාත්මක කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග

* III වන ජෝර්ජ් රජු ඇමරිකානු ජනපදවලින් බදු අය කිරීම සඳහා වූ පනත්වලට පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට කැබිනට් මණ්ඩලයට බල කිරීම
* වාණිජවාදී නීති දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමට බල කිරීමේ සහායට ඇමරිකාවට හමුදාව යැවීම
* බටහිර දේශ සීමාවෙන් ඔබ්බට ජනපද ව්‍යාප්තිය තහනම් කිරීම (ලාභයට ඉඩම් ලබා ගැනීමට බලා සිටි ඇමරිකානු වෙළෙඳ ව්‍යාපාරිකයන්ට මෙය තර්ජනයක් විය. )
* සීනි පනත (1764 ජනපද වාසීන් ආනයනය කරන ලද උක් පැණි වෙනුවෙන් බද්දක් ගෙවීමට නියම කිරීම. හොර රහසේ සීනි ආනයනය සඳහා කටයුතු කළ ද බ්‍රිතාන්‍ය රජය මෙය වළක්වන ලදි.)
* ඇමරිකාවේ සිට බ්‍රිතාන්‍ය හමුදාව සඳහා නඩත්තු වියදම දැරීමට නියම කිරීම. ( මෙය ඇමරිකානුවන්ගේ කෝපය වැඩි කිරීමට හේතුවක් විය.)
* මුද්දර පනත ( 1765) සහ එය අවලංගු කිරීම. 1765 දී බ්‍රිතාන්‍ය අගමැති වූ ජෝර්ජ් ග්‍රැන්විල් මුද්දර පනත මගින් නව බදු ක්‍රමයක් හඳුන්වා දෙන ලදි. බදු ලෙස අය කළේ සුළු මුදලක් වුව ද ජනපද වාසීන් එය තරයේ ප්‍රතික්ෂේප කරන ලදි. බදු අය කිරීමට බ්‍රිතාන්‍යයට අයිතියක් නැති බව ප්‍රකාශ විය. එමගින් “නියෝජනයක් නැත්නම් බදුත් නැත” යන සටන් පාඨය ද බිහි විය.

### මුද්දර පනතට විරුද්ධත්වය ප්‍රකාශ කළ ආකාරය

* මුද්දර එකතු කරන්නන්ගේ රූකඩ සාදා ගිනිබත් කිරීම
* මුද්දර තොග විනාශ කිරිම
* එංගලන්තය සහ නිව්යෝර්ක් ජනපදවල කැරැලි ඇති කිරීම
* නිව්යෝර්ක්වල මුද්දර පනත පිළිබඳ සමුළුවක් පවත්වා ජනපද වාසීන්ගේ අනුමැතිය නොමැතිව ඔවුන්ගෙන් බදු අය කිරීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට බලයක් නොමැති බවට යෝජනාවක් සම්මත කර ගැනීම

මෙම තත්ත්වයෙන් පසු බ්‍රිතාන්‍ය ආණ්ඩුව මුද්දර පනත අවලංගු කරන ලදි.

අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී. එම්. මොරගොඩ මයා. ජාතික. තරුණ සේවා සභාව. (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

මේ සම්බන්ධව ප්‍රවණතා දෙකක් කැපී පෙනේ

ජනපද වාසීන් විරුද්ධතාව ප්‍රකාශ කළේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට බදු අය කිරීමට අයිතිවාසිකමක් ඇත යනුවෙන් කළ ප්‍රකාශයට බව

උද්ඝෝෂණ ව්‍යාපාරය නිසා ජනපද නවයක් අතර එකමුතුකමක් ගොඩනැගීම

**2. ටවුන්සෙන්ඩ් පනත ( 1767 )**

1767 දී ග්‍රෑන්විල්ගෙන් පසු අගමැති ධූරයට පත් වූයේ විලියම් පිට් ය. ඔහුගේ ඇමති මණ්ඩලයේ භාණ්ඩාගාර ලේකම් ධූරයට පත්වූයේ චාල්ස් ටවුන්සෙන්ඩ් ය. ඔහු ජනපද වාසීන්ගෙන්

* වීදුරු
* ටින්
* සායම් වර්ග
* කඩදාසි
* තේ

සඳහා බදු අය කර ගැනීමට යෝජනාවක් සම්මත කර ගන්නා ලදි. ඊට අමතරව "මියුටිනි පනත " ක්‍රියාත්මක නොකිරීමේ වරදට නිව්යෝක් ජනපදයේ ව්‍යවස්ථාදායක මණ්ඩලය අත්හිටුවීමට ද තීරණය කරන ලදි.

## ටවුන්සෙන්ඩ් පනතට ජනපද වාසීන් විරුද්ධතාව ප්‍රකාශ කළ ආකාරය

* බොස්ටන්, පිලඩෙල්ෆියා, සහ නිව්යොර්ක් නගරවල වෙළෙන්දන් බ්‍රිතාන්‍ය භාණ්ඩ වර්ජනය කිරීම.
* පනත අවලංගු කරන ලෙස බ්‍රිතාන්‍ය වෙළෙඳුන් ආණ්ඩුවෙන් ඉල්ලා සිටීම
* ජනපද වාසීන් බ්‍රිතාන්‍ය භාණ්ඩ වර්ජනය කොට ඒ වෙනුවට භාණ්ඩ ජනපදවල නිෂ්පාදනය කර ගැනීම


**නෝත් සාමි ලේකම් ධූරයට පත්වීමත් සමග තේ බද්ධ හැර සියලු බදු අහෝසි කිරීමට කටයුතු කරන ලදි.**

බොස්ටන් වරායට තීරු බදු නිලධාරීන් පත් කරන ලදි. මීට විරුද්ධත්වය ප්‍රකාශ කළ මහජනතාව උද්ඝෝෂණය කරන ලදි. මෙම උද්ඝෝෂණවලට නායකත්වය දෙන ලද්දේ සැමුවෙල් ඇඩම්ස් ය. උද්ඝෝෂණ මැඩ පැවත්වීම සඳහා බ්‍රිතාන්‍ය ආරක්ෂක භටයන්ට සිදු විය. එම ඝාතනය සැමුවෙල් ඇඩම්ස් හඳුන්වා දුන්නේ "බොස්ටන් ඝාතනය" ලෙස ය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටි. එම්. මොරගොඩ මයා. ජාතික. තරුණ සේවා සභාව. (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk



සැමුවෙල් ඇඩම්ස්


## බ්‍රිතාන්‍ය ආණ්ඩුව "තේ බද්ද" පමණක් අවලංගු නො කළේ කුමක් නිසා ද?

* ජනපද වාසීන්ගෙන් බදු අය කිරීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුවට අයිතියක් ඇති බව පෙන්වයි
* ඉන්දියානු වෙළෙඳ සමාගම සතුව පැවති විශාල තේ තොග ඇමරිකානු ජනපද වාසීන්ට අලෙවි කොට ලාභ ලබා ගැනීමට නෝත් සාමිවරයාට අවශ්‍ය විය.

ජනපද වාසීන් නෝත් සාමිවරයාගේ මෙම ක්‍රියාවලියට ද විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදි.

## බොස්ටන් තේ සාදය (1773 දෙසැම්බර් 16)

වරායවල දී තේ ගොඩබෑම වැළැක්වීමට කටයුතු කළ ජනපද වාසීන් බොස්ටන් වරායේ දී පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගමේ නැව්වලට නැගුණු සැමුවෙල් ඇඩම්ස් ඇතුළු පිරිස එහි තිබූ තේ පෙට්ටි මුහුදට විසිකර දැමූහ. එය **බොස්ටන් තේ සාදය** ලෙස හැඳින්වේ.



අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී. එම්. මොරගොඩ මයා. ජාතික. තරුණ සේවා සභාව. (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## බොස්ටන් තේ සාදයෙන් පසු


* මැසචුසෙට්ස් ජනපදයට ලබා දී තිබූ වරදාන පත්‍රය අවලංගු කිරීම
* බොස්ටන් වරාය සෙසු ප්‍රදේශ හා සම්බන්ධ වීම අවහිර කිරීම
* දේශපාලන රැස්වීම් පැවැත්වීම තහනම් කිරීම
* අපරාධ කළ බවට තීරණය කළ ජනපද වාසීන්ගේ නඩු එංගලන්තයේ දී විසඳීම ආරම්භ කිරීම
* මැසචුසෙට්ස්වලට තව දුරටත් හමුදා කණ්ඩායම් යැවීම

## 1774 ප්‍රථම මහද්වීපික සම්මේලනය

බ්‍රිතාන්‍ය පාලකයන්ගේ ක්‍රියාකලාපය ජනපද වාසීන් තව දුරටත් කෝප ගැන්වීමට සමත් විය. ඒ පිළිබඳව තීරණයක් ගැනීමට ප්‍රථමවරට මහද්වීපික සම්මේලනයක් කැඳවන ලදි. වර්ජිනියාවේ ව්‍යවස්ථාදායක මණ්ඩලය මගින් 1774 සැප්තැම්බර් මාසයේ පිලඩෙල්පියාහි දී මෙම රුස්වීම පැවැත්වීමට කටයුතු කරන ලදි. ජෝර්ජියා හැර අනෙක් සියලු ජනපදවල නියෝජිතයන් එයට සහභාගී විය.

ප්‍රථම මහද්වීපික සමුළුවට සහභාගී වූ නායකයන් :-

* ජෝර්ජ් වොෂින්ටන්
* ජෝන් ඇඩම්ස්
* සැමුවෙල් ඇඩම්ස්
* ජෝන් ජේ


ජෝන් ඇඩම්ස්


ජෝර්ජ් වොෂින්ටන්

### ප්‍රථම මහද්වීපික සම්මේලනයෙන් ගත් ක්‍රියාමාර්ග

* ජනපද වාසීන් වෙත පනවා තිබූ දුෂ්කරතා ඉවත් කරන ලෙස ඉල්ලමින් තුන්වන ජෝර්ජ් රජුට සන්දේශයක් යැවීම
* බ්‍රිතාන්‍ය භාණ්ඩ වර්ජනය කිරීමට තීරණය කිරීම
* එම කටයුතු සංවිධානය කිරීමට “ මහද්වීපික සංගමය ” නමින් සංවිධානයක් පිහිටුවීම
* යළි රැස්වීම් සඳහා දිනයක් තීරණය කිරීම

අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී. එම්. මොරගොඩ මයා. ජාතික. තරුණ සේවා සභාව. (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# නිදහස ප්‍රකාශ කිරීම ( 1774 ජුලි 04 )

## දෙවන මහද්වීපික සම්මේලනය

මේ සඳහා පිලඩෙල්පියාහි දී රැස්විය. ජෝර්ජියාව හැර සෙසු සියලු ම ජනපදවල නියෝජිතයන් මීට සහභාගී විය. මෙහි දී අවධාරණය කරන ලද විශේෂිත කරුණු :-

* යුද්ධයට සහාය දැක්වීමට තීරණය කිරීම
* සාමය වෙනුවෙන් පෙත්සමක් යැවීම
* යුද්ධයට හේතු සහ අවි දැරීමේ අවශ්‍යතාව පැහැදිලි කළ ප්‍රකාශයක් නිකුත් කිරීම
* බ්‍රිතාන්‍යයෙන් වෙන් වීමට ජනපද තීරණය කිරීම

දෙවන මහද්වීපික සම්මේලනයේ දී ජනපද විසින් ගනු ලැබූ තීරණවලට විරුද්ධව බ්‍රිතාන්‍ය ආණ්ඩුව නිශේධ පනත ක්‍රියාත්මක කරන ලදි.

**නිශේධ පනත**

ජනපදවල ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු තහනම් කිරීම

## යුද්ධය ආරම්භ වීම

මහද්වීපික සම්මේලනය විසින් යුද්ධය සඳහා සූදානම් වීමට අවශ්‍ය විධිවිධාන යොදන ලදි. අවි ආයුධ රැස් කළ අතර, සටන් කිරීම සඳහා සෙබළුන් ද පුහුණු කරන ලදි. මෙසේ එක්රැස් කළ අවි ආයුධ හා පුහුණු කළ සෙබළුන් අල්ලා ගැනීම සඳහා බොස්ටන්වල සිටි බ්‍රිතාන්‍ය අණදෙන නිලධාරියා විසින් හමුදා පිටත් කර හරින ලදි. හමුදාව සහ පුහුණු කළ සෙබළුන් අතර ගැටීම් ඇති විය. එයින් ජනපදවාසී සෙබළුන් කිහිප දෙනෙක් මිය යන ලදි. ආපසු එන බ්‍රිතාන්‍ය හමුදාවට යටත්විජිත වාසීන්ගේ වෙඩි පහරවලට ගොදුරු වන්නට සිදුවිය. ඉන් බ්‍රිතාන්‍ය භටයන් 250ක් පමණ තුවාල ලැබූහ. බ්‍රිතාන්‍යයන්ගේ දාමරික ක්‍රියාවන් ගැන ආරංචිය පැතිර යත් ම යුද්ධය ආරම්භ විය.



මහද්වීපික හමුදාවේ අණදෙන නිලධාරියා වූයේ ජෝර්ජ් වොෂින්ටන් ය. විලියම් හාවේ විසින් මෙහෙයවන ලද බ්‍රිතාන්‍ය හමුදාව නවීන ආයුධ සහිතව මනා ලෙස පුහුණු කර තිබුණි. මහද්වීපික හමුදාවට සුදුසු ආයුධ නැතුවා පමණක් නොව මනා පුහුණුවක් ද ලබා නොතිබිණි.


ඇමරිකන් යුද්ධ කණ්ඩායමට රටවල් කිහිපයකින් ම ආධාර උපකාර ලැබුණි.

අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී. එම්. මොරගොඩ මයා. ජාතික. තරුණ සේවා සභාව. (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

ආධාර දුන් රටවල්

* ප්‍රංශය
* ස්පාඤ්ඤය
* ඕලන්දය
* රුසියාව
* ඩෙන්මාර්කය
* ස්වීඩනය





යුද්ධයෙන් ජානපදිකයන් ජයග්‍රහණය කරන ලදි. ඊට බලපාන ලද හේතු

* ඇමරිකාව හා එංගලන්තය අතර දුර ප්‍රමාණය විශාල වීම
* ජොර්ජ් වොෂින්ටන්ගේ දක්ෂ නායකත්වය
* ඉංග්‍රීසි යුද්ධ සෙනෙවියන්ට ගරිල්ලා සටන් ක්‍රම පිළිබඳව අවබෝධයක් නොතිබීම
* වෙනත් රටවල් බ්‍රිතාන්‍යයට විරුද්ධව ඇමරිකන් ජනපදවාසීන්ට ආධාර කිරීම
* රුසියාව, ස්වීඩනය වැනි රටවල් එංගලන්තයට විරුද්ධව මධ්‍යස්ථ බල මණ්ඩලයක් ඇරඹීම
* බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ අනෙක් ප්‍රදේශවල ද ආණ්ඩු විරෝධී සටන් ඇරඹීම

අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී. එම්. මොරගොඩ මයා. ජාතික. තරුණ සේවා සභාව. (2017-2018)
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## යුද්ධයේ ප්‍රතිඵල

* 1778 දී බ්‍රිතාන්‍ය ජනපද දහතුනේ නිදහස නීත්‍යානුකූලව පිළිගත් පැරිස් ගිවිසුම් අත්සන් කිරීම
* නිදහස ලැබූ ජනපදවලට අයත් දේශසීමා නියම කිරීම
* කැනඩාවේ දකුණු සීමාවේ සිට ප්ලෝරීඩාවේ උතුරු සීමාව දක්වා ද අත්ලන්තික් මුහුදේ සිට මිසිසිපි ගඟ දක්වා ද පැතිර තිබූ ප්‍රදේශ ඇමරිකා එක්සත් ජනපදයට අයිති විය
* ඇමරිකා එක්සත් ජනදය නම් ස්වාධීන රාජ්‍ය බිහිවීම
* සමස්ත මානව සංහතියට ම නිදහසේ අගය පෙන්වා දුන් අවස්ථාවක් වීම
* මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳව ලොව පුරා උනන්දුවක් ඇතිවීම
* ලෝකයේ ප්‍රථම ලිඛිත සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බිහිවීම




### ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

12 ශ්‍රේණිය - ඉතිහාසය ගුරු මාර්ගෝපදේශය

11 ශ්‍රේණිය - ඉතිහාසය පෙළපොත

ලෝක ඉතිහාසය - බී.වී රාවෝ
පරිවර්තනය - මහාචාර්ය මාලනී ඇඳගම

අපේ උරුමය 3 - ආචාර්ය G.C. මෙන්ඩිස්
නූතන ඉංග්‍රීසි ඉතිහාසය - ජෝර්ජ් W. සවුත්ගේට්
පරිවර්තනය - N. A. D.ගුණතිලක



අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී. එම්. මොරගොඩ මයා. ජාතික. තරුණ සේවා සභාව. (2017-2018)


Copyright © www.e-thaksalawa.moe.gov.lk

### පැවරුම 1

ඇමරිකා මහාද්වීපය තුළ නව ජනපද වර්ධනය වූ ආකාරය පැහැදිලි කිරීම සඳහා Power Point Presentation එකක් නිර්මාණය කරන්න.

### පැවරුම 2

ඇමරිකානු නිදහස් සටනේ විවිධ අවස්ථා දැක්වෙන ඡායාරූප, රූප සටහන් අන්තර්ජාලය තුළින් සොයා ගෙන ඡායාරූප එකතුවක් සකස් කරන්න.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී. එම්. මොරගොඩ මයා. ජාතික. තරුණ සේවා සභාව. (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk